**අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2017**

**------------------------------------------------------------**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයට අදාළ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය සහ 2014 ඔක්තෝබර් 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පළකරන ලද 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 17(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 49(1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළයුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මේ සම්බන්ධයෙන් විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2018 මැයි 24 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී දරා තිබූ රු.496,678 ක පුනරාවර්තන ස්වරූපයේ වියදම් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර ක්ෂය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.471,844 කින් අඩුවෙන් සහ දේපල පිරියත හා උපකරණවල ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07 හා 69 ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආපසු ආරම්භ කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු එකතුව රු.193,350 ක් වූ වත්කම් 03 ක් ක්ෂය කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.3,707 කින් අඩුවෙන් සහ දේපල පිරියත සහ උපකරණවල ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**2.3** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

2009 අප්‍රේල් 16 දිනැති අංක 07/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සටහන් කළ යුතු වුවද විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණු අතර, අවිධිමත් ලෙස සහ නිසි අධීක්ෂණයකින් තොරව ලේඛනයක පැමිණීම පිටවීම සටහන් තබා තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,936,933ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.453,080 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,390,013 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ කාර්ය මණ්ඩල පිරිවැය රු.5,378,647 කින් හා ශිෂ්‍ය අධ්‍යයන වියදම් රු.2,589,329 කින් ඉහළ යාම ඉහත ඌනතාවයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 2 ක මූලා ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේදී රු.148,756 ක ඌනතාවයක් හා 2016 වර්ෂයේදී රු. 453,080 ක අතිරික්තයක්ද සමාලෝචිත වර්ෂයේදී රු.7,936,933 ක ඌනතාවයක්ද ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා දේපල පිරියත හා උපකරණ සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2015 වර්ෂයේදී රු.27,643,516 ක්වූ විද්‍යායතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.40,107,642 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්ය සාධනය

--------------------

#### 4.1.1 සැලසුම් කිරීම

-----------------

ආයතනය විසින් 2016 – 2018 සඳහා සකස් කර තිබූ සංයුක්ත සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර ගත යුතු පහත සඳහන් ක්‍රියාකාරකම් වලට ලඟා වී නොතිබුණි.

(අ) ආරම්භක ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වර්ෂයේදී 270ක් දක්වා ද 2017 වර්ෂයේදී 300 දක්වා ද වැඩිකර ගැනීමට ආයතනය විසින් සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, 2016 හා 2017 වර්ෂ වලදී ලියාපදිංචි කර තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් සිසුන් 258 ක් හා 191 පමණක් විය. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 26 ක අඩුවීමක් දක්නට ලැබූ අතර පාඨමාලා සඳහා සිසුන් ආකර්ශනය කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2016 – 2018 සංයුක්ත සැලැස්මට අනුව, විද්‍යායතනය 2015 වර්ෂයේදී පාඨමාලා 8 කින් ආරම්භ කර වාර්ෂිකව පාඨමාලාව බැගින් වර්ධනය කර සමාලෝචිත වර්ෂය වන විට පාඨමාලා 10 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ද ක්‍රියාත්මක කර තිබුණේ පාඨමාලා 8 ක් පමණි.

(ඇ) විද්‍යායතනයේ අධ්‍යයන පරිසර වර්ධනය කිරීමට අදාලව වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (Career Guidance Unit) හා ශිෂ්‍ය උපදේශන ඒකකය (Student Counseling) ස්ථාපිත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් මෙම ඒකක ස්ථාපිත කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්ව සමාලෝචනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන පනත ප්‍රකාරව, පාලක මණ්ඩලය විසින් සකස් කරන ලද නියමාවලියට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5,6 හා 7 මට්ටමේ පාඨමාලා සහ ඒ හා සමාන මට්ටම්වල වෙනත් තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම විද්‍යායතනයේ අරමුණු ලෙස දක්වා තිබුණි. එසේ වුවද, මේ වනවිට පාඨමාලා ආරම්භ කර වර්ෂ 03 ක් ඉක්ම ගොස් තිබුණ නමුත් විද්‍යායතනය පවත්වන පාඨමාලා 08 න් 06 ක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5,6 හා 7 මට්ටමේ වෘත්තීය තත්ත්ව පාලන සහතිකය (accreditation) තෘතීයික හා වෘත්තීය අධ්‍යයන කොමිෂන් සභාවෙන් ලබාගෙන නොතිබුණි.

(ආ) ඉහත කී නියමාවලිය පරිදි ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 5 හා 6 පාඨමාලා සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් කොටස් දෙකක් යටතේ වර්ග කර එයින් සියයට 60 ක් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4 සමත් අයදුම්කරුවන් සඳහාද ඉතිරි සියයට 40 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) අයදුම්කරුවන්ටද වෙන් කර තිබුණි. නමුත්, විද්‍යායතනය විසින් 2016 වර්ෂය සඳහා ලියාපදිංචි කර තිබූ සිසුන් 258 දෙනෙකු සහ 2017 වර්ෂය සඳහා සිසුන් 191 දෙනෙකු ලියාපදිංචි කර තිබුණද එම සිසුන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සුදුසුකම් මත පමණක් බඳවාගෙන තිබුණි.

(ඇ) 2017 වර්ෂයේදී පාඨමාලා 8 ක් සඳහා ලියාපදිංචි කර තිබූ සිසුන් 191 දෙනෙකු අතුරින් පාඨමාලා 7 ක සිසුන් 22 දෙනෙකු පාඨමාලාව හැරගොස් තිබුණු අතර අධ්‍යයන කටයුතු වල නියැලී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 169 ක් දක්වා අඩු වී තිබුණි. විද්‍යායතනයේ එක් එක් පාඨමාලාවන් සඳහා ශිෂ්‍යයන් ලියාපදිංචියද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 12 සිට සියයට 47 දක්වා පරාසයකින් අඩුවී තිබූ බව නිරීක්ෂණය විය.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

අනුමත කාර්ය මණ්ඩලයට අයත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දේශකවරුන් 08 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

විද්‍යායතනය සඳහා භාවිතා කරන ගොඩනැගිල්ල හා එය පිහිටි ඉඩමෙහි හිමිකම සමාලෝචිත වර්ෂය තුළදීද විද්‍යායතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කරගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර ඒ සඳහා 2017 ඔක්තෝබර් 03 දිනැති 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත සම්මත කර චක්‍රලේඛ මගින් සියළු රජයේ ආයතන දැනුවත් කර තිබුණි. ඒ අනුව, තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව සියළුම රාජ්‍ය ආයතන දැනුවත් විය යුතු වුවද, විද්‍යායතනය ඒ සම්බන්ධයෙන් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එකී කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනා ගෙන නොතිබුණි.

**6. ගිණුම්කරණ කටයුතුභාවය සහ යහපාලනය**

**6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**6.1.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

උද්‍යාන අලංකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ලංසුකරුවන් තිදෙනෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර අවම මිල වූ රු.3,105,237 ඉදිරිපත් කරන ලද ලංසුකරුට 2017 ජූනි 14 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ලංසුකරු විසින් 2017 ජූනි 19 දින එවන ලද ලිපියක් මගින් කොන්ත්‍රාත්තුව පිළිගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. නමුත් මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු රු.35,000 ක් වටිනා ලංසු සුරක්ෂණය බැංකුව වෙත ඉදිරිපත් කර මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

-----------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | දේපළ පිරියත උපකරණ පන්ති නිසි ලෙස වර්ගීකරණය කර නොතිබීම. |
| (ආ) ඉන්වෙන්ට්‍රි පාලනය | වාර්ෂිකව බඩු ලේඛන පොත් තුලනය නොකිරීම. |
| (ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව වැඩ හා සැපයුම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |